# නිවේදනය

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2020/2021(2023)

2024.04.19 දිනැතිව අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2020/2021(2023) සඳහා එක් එක් විෂය යටතේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාමලේඛනය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයන් හා නියමිත වේලාවන් සඳහන් කරන ලද කැඳවීම් ලිපි අයදුම්කරුවන් විසින් අයදුම්පත්වල සඳහන් කර ඇති ලිපිනයන් වෙත මේ වන විට යොමු කරමින් පවතී. (කැඳවීම් ලිපියෙහි ආදර්ශ ආකෘතිය, සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයන් හා නියමිත වේලාවන් සඳහන් කල ලේඛනයද මේ සමඟ දක්වා ඇත)

අදාළ දිනයන්වල දක්වා ඇති වේලාවන් වලදී කැඳවීම් ලිපියෙහි සඳහන් කර ඇති උපදෙස් ප්‍රකාරව සියලු ලේඛන සකස් කරගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වෙත පැමිණිය යුතුය. (තමාට නියමිත දිනට නියමිත වේලාව තුළ පැමිණීම අනිවාර්ය වේ.)

එදිනට කැඳවීම් ලිපියෙහි සඳහන් සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ඇතුළත් ගොනුවක් ද එම ලිපි ලේඛනයන්හි සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපී ගොනුවක් වෙනම ද, ඉහත දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ අංකය සහ මණ්ඩල අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. (ලිපිගොනු කවරය සකස් විය යුතු ආකාරය දැක්වෙන ආකෘතියක් මේ සමඟ සඳහන් කර ඇත.) සියලුම සහතිකපත්‍ර/ලේඛන පිටපත් මත ඒවා සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතුය.

කැඳවීම් ලිපියෙහි අංක 03 යටතේ දක්වා ඇති අනු අංක VII, IX, X හි සඳහන් ආකෘති පත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර නියමිත දිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතු අතර, සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු මෙම ආකෘති පත්‍ර පසු අවස්ථාවක ඉදිරිපත් කළහොත් බාර නොගන්නා බැවින් එය වෙබ් අඩවියෙන් බාගත කරගෙන කඩිනමින් සම්පූර්ණ කරවා ගැනීම අයදුම්කරුගේ වගකීමක් වේ.

සැ.යු. සම්මුඛ පරීක්ෂණ දිනය වන විට කැඳවීම් ලිපිය නොලද හොත් වෙබ් අඩවියෙන් බාගත කරගත් ලිපිය ඉදිරිපත් කරන්න.